052915
2015/07/
MDL/PR
B-82

# කෝල්මුර යාගය; වත්පිළිවෙත් හා සමාජය

University of the Visual & Performing Arts
LIBRARY
No. 46,
Horton Place,
Colombo 07.

සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ පශ්චාද් උපාධි අධ්‍යයන කේන්ද්‍රය මගින් පවත්වනු ලබන ප්‍රාසංගික කලාපති පර්යේෂණ උපාධිය සඳහා ඉදිරිපත් කරන ස්වාධීන නිබන්ධය යි.

බී. ඒ. ඩී. අනුර ශාන්ත කුමාර

DD/MP/DA/08/014

2013

පශ්චාද් උපාධි අධ්‍යයන කේන්ද්‍රය

සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය

# හැඳින්වීම

ලෞකික දිවියේ විවිධ අපේක්ෂාවන් පූරණය කරගැනීම පිණිස විවිධ වූ වත් පිළිවෙත් පැවැත්වීමට සිංහල ගැමි බෞද්ධයෝ පුරුදුව සිටිති. බුදු දහම තුළින් සාක්ෂාත් කර ගැනීමට නොහැකි වූ අපේක්ෂාවන්ට මෙහි දී ප්‍රමුඛත්වය හිමි විය. ඔවුහු ඒවා හඳුන්වනුයේ ශාන්තිකර්ම, තොවිල්, යාග, කංකාරි මඩු, වෛද්‍ය ආදි නම් වලිනි. ඒවා දෙවියන්, යකුන් හා ග්‍රහයින් විෂයෙහි පවත්වන අතර අපගේ අධ්‍යයනයට ලක් වන කෝල්මුර යාගය ද දේව තොවිල් ගණයේ ලා සැළකේ. මාතර හා තදාශ්‍රිත ප්‍රදේශයන් හි පැතිර පවත්නා මෙකී යාගය, කප් ඉන්දුම් මඩුව, කප් ඉන්දුම වැනි නම්වලින් ද හඳුන්වනු ලැබේ. පොදුවේ මෙම යාගය, 'දේව තොවිලය' නමින් තත් ප්‍රදේශයෙහි ප්‍රචලිතව පවතී. එමෙන් ම මෙම යාගය, මානව වර්ගයාගේ පැවැත්මට ඉවහල් වන සශ්‍රීකත්වය හා සෞභාග්‍යය අරභයා ගොඩ නැගී ඇති බව පෙනී යයි.

ප්‍රාකෘතික ලෝකය යථා ස්වරූපයෙන් අවබෝධ කොට ගත නොහුණු ප්‍රාථමික ජනයා ක්‍රමිකව පැතිර යන රෝගී තත්වයන් හා ස්වභාවික විපත්වලින් තමා වෙත, තම අස්වනු වෙත පැමිණෙන උපද්‍රවයන් කිසියම් අදෘෂ්‍යමාන බලපෑමකින් සිදු වන්නේ යැයි විශ්වාස කළ හ. එම නිසා එවැනි රෝගෝපද්‍රවයන් ගෙන් ආරක්ෂා වීමටත්, බව භෝග සම්පත්වල වර්ධනයටත්, ගව මහීෂාදීන්ගේ ආරක්ෂාව උදෙසාත් අදෘෂ්‍යමාන බලවේගයන්ගේ පිහිට පැතූ හ. එවැනි අවස්ථාවල දී පත්තිනි දේවතාවිය මුල් කොට ගනිමින් ගොඩ නැගුණු විවිධ වත් පිළිවෙත් රට පුරා ව්‍යාප්තව පවතී. ඒවා උඩරට ප්‍රදේශවල දී ගම්මඩුව නමින් ද, රයිගම හා සියනෑ කෝරළයේ දී දෙවොල් මඩුව හා ගම්මඩුව නමින් ද, සබරගමුව පළාතේ දී පහන් මඩුව නමින් ද හඳුන්වමින් පවත්වනු ලැබේ. මාතර හා තදාශ්‍රිත ප්‍රදේශයන් හි දී එය හඳුන්වනුයේ කෝල්මුර යාගය නමිනි. තත් යාගය, පත්තිනි දේවතාවිය මුල් කොට ගෙන ගැයෙන පන්තිස් කෝල්මුර ගායනාවන් ට මූලිකත්වය දෙමින් ඒ වටා ගොඩ නැගී ඇති බව පෙනේ. සශ්‍රීකත්වයත් සෞභාග්‍යයත් උදෙසා ශ්‍රී ලාංකේය ජන සමාජයෙහි දීර්ඝ කාලයක් මුළුල්ලේ ගොඩ නැගී ක්‍රමිකව විකාශනය වූ ඇදහිලි, විශ්වාස, සිරිත් විරිත් හා සාරධර්ම පාදක කොටගෙන ගොඩ නැගුණු පූජා කර්ම අතුරින් කෝල්මුර යාගය මෙතෙක් කිසිදු පර්යේෂණයකට භාජනය වී නොමැත. මෙය ඒ පිළිබඳ කරන ලද ප්‍රථම පර්යේෂණය බව අපගේ විශ්වාසය යි.

කෝල්මුර යාගය සම්බන්ධයෙන් සිදු කරන ලද පූර්ණ අධ්‍යයනයක් පවතින සාහිත්‍ය ඇසුරෙහි හමු නොවන අතර ඒ පිළිබඳ ව විශේෂයෙන් අවධානය යොමු වී ඇත්තේ අවස්ථා කිහිපයක දී පමණක් බව හඳුනාගත හැකි විය. ජයසේන කෝට්ටගොඩ විසින් තත් යාගය පිළිබඳව 1980 වසරේ දී ලංකාදීප පුවත් පතට ලිපියක් ඉදිරිපත් කර ඇති අතර ඔහුගේ ම 1997 දී රාජ්‍ය සාහිත්‍ය සම්මානයෙන් පිදුම් ලත් පහතරට ශාන්තිකර්ම සාහිත්‍යය නැමැති කෘතියෙහි ද මේ පිළිබඳ සඳහන් වේ. එහි දී මාතර ප්‍රදේශය ආශ්‍රිතව මෙවැනි ශාන්තිකර්මයක් ඇති බව නාමිකව හඳුන්වා දී ඇතත් දීර්ඝ වශයෙන් විස්තර ඉදිරිපත් නොකෙරේ. මේ පිළිබඳ අවධානයට ලක් වූ තවත් අවස්ථාවක් වන්නේ, 2002 වර්ෂයේ දී විශ්වවිද්‍යාලයීය ලලිත කලා අධ්‍යාපනඥයින්ගේ සංගමය මගින් ප්‍රකාශිත ලලිත කලා සාර සංග්‍රහයෙහි ලා '' පත්තිනි දේව ඇදහිල්ල තුළ කෝල්මුර යාගයේ සුවිශේෂතා'' යන මැයෙන් ලයනල් බෙන්තරගේ විසින් සපයන ලද ලිපිය යි. එය ද කෝල්මුර යාගය පිළිබඳ ව පර්යේෂණාත්මක ලිපියකට ප්‍රමාණවත් තොරතුරු පමණක් ඉදිරිපත් කරන්නකි. එයින් මෙම යාගය සම්බන්ධයෙන් යම් අදහසක් ලබා දෙන මුත් පූර්ණ පර්යේෂණයක් වශයෙන් ගිනිය නොහැකි ය. මීට අමතරව 1999 වසරේ දී එල්. පී. ඉන්ද්‍රානි වසන්තා විසින් කොළඹ විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍රපති උපාධිය සඳහා ''දෙවිනුවර ජනශ්‍රැති'' නමින් පර්යේෂණ නිබන්ධයක් ඉදිරිපත් කරන ලදි. එහි එක් පරිච්ඡේදයක දී කෝල්මුර යාගය සම්බන්ධව අවධානය යොමු කර ඇතත් එය තත් යාගය පිළිබඳ ප්‍රාමාණික පර්යේෂණයක් නොවේ. එබැවින් කෝල්මුර යාගය පිළිබඳ ව අධ්‍යයනයක් කිරීම කාලීන අවශ්‍යතාවයක් බව අපට පසක් විය. නවීන තාක්ෂණයේ දියුණුව සමඟ අත්වැල් බැඳ ගත් මෙවන් යුගයක ඇදහිලි විශ්වාස අවඥාවෙන් බැහැර කරනු ලබන පිරිස් සිටිය ද ඒවායේ අන්තර්ගත සාරධර්ම, සංස්කෘතිකමය හර පද්ධතීන් හා යහපත් මානව සබඳතා ප්‍රතික්ෂේප කළ නොහැකි ය. උක්ත කරුණු සළකා බැලීමෙන් කෝල්මුර යාගය නැමැති දේව තොවිලය අපගේ පශ්චාද් උපාධි නිබන්ධය සඳහා මාතෘකාව වශයෙන් තෝරා ගනු ලැබිණ.

මෙම අධ්‍යයන පරිච්ඡේද සතකින් යුක්ත ය. පළමු පරිච්ඡේදයෙහි ලා කෝල්මුර යාගයේ ඓතිහාසික පසුබිම සාකච්ඡාවට බඳුන් විය. තත් යාගය හා සම්බන්ධ මූලික කරුණු වන එහි ආරම්භය හා විකාශනය, පත්තිස් කෝල්මුර සමඟ දක්වන සබඳතාවය විස්තරාත්මකව ඉදිරිපත් කෙරේ. කෝල්මුර යාගයෙහි පුද ලබන දේව කොට්ඨාස පිළිබඳව

දෙවන පරිච්ඡේදයේ කරුණු දක්වන අතර එක් එක් දෙවිවරුන් සම්බන්ධ තොරතුරු වෙන වෙන ම ගෙන හැර දක් වේ. තුන්වන පරිච්ඡේදය මගින් කෝල්මුර යාගයේ වත් පිළිවෙත් හා පූජාවිධි රටාව විමසුමට ලක් කරන ලදි. තත් යාගයේ රංග සැරසිලි, රංග භාණ්ඩ, පූජා භාණ්ඩ හා රංග වස්ත්‍රාභරණ පිළිබඳව සිව්වන පරිච්ඡේදයෙන් ද, කොල්මුර යාගය හා රයිගම දෙවොල් මඩුවේ විශේෂතා සම්බන්ධයෙන් පස් වන පරිච්ඡේදයෙන් ද අවධානය යොමු කෙරිණි. එහි දී වත්පිළිවෙත් හා පූජා විධි රටාවේ විශේෂතා, රංග වස්ත්‍රාභරණ හා භාවිත සැරසිලිවල විශේෂතා සංසන්දනාත්මකව ඉදිරිපත් කිරීමට පස් වන පරිච්ඡේදයෙහි ලා උත්සාහ දරා ඇත. කෝල්මුර යාගය හා බැඳි සමාජ සම්බන්ධතාවය සය වන පරිච්ඡේදයේ විමසා බලන ලදි. එනම් තත් යාගය සමාජය සමඟ සම්බන්ධ වන ආකාරය සහ අද්‍යතනයේ එය සමාජගත වී ඇති ආකාරය යි. සමස්ත අධ්‍යයනයෙන් එළඹි නිගමන හා සමාලෝචන සත්වන පරිච්ඡේදය මගින් ඉදිරිපත් කෙරේ.